# පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
# කැලණිය විශ්වවිද්‍යාලය

## වාර්ෂික වාර්තාව - 2014

## வருடாந்த அறிக்கையும் கணக்கும் - 2014

# ANNUAL REPORT - 2014

# පටුන


| | පිටු අංකය |
|---|---|
| දර්ශන ප්‍රකාශනය | 01 |
| මෙහෙවර ප්‍රකාශනය | 02 |
| ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන ව්‍යුහය | 03 |
| අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය | 04 - 10 |
| ශිෂ්‍ය තොරතුරු සහ විභාග කටයුතු | 11 - 13 |
| අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර | 13 - 14 |
| වැඩසටහන් තොරතුරු | 15 - 29 |
| ආයතනයෙහි මූල්‍ය කටයුතු | 29 - 31 |
| අවසාන ගිණුම් - 2014 | 32 – 43 |
| පසුගිය වර්ෂ 05ක ආයතනයේ මූල්‍ය තත්වය | 44 |
| විගණකාධිපති වාර්තාව - 2014 හා පිළිතුරු | 45 - 60 |

## 01. දැක්ම

### දැක්ම

පාලි හා බෞද්ධ අධ්‍යයන සඳහා ලෝකයේ විශිෂ්ටතම පශ්චාත් උපාධි පර්යේෂණ මධ්‍යස්ථානය බවට පත්වීම

### Vision

To become the Centre of Excellence for Postgraduate Research in Pali and Buddhist Studies in the World.

## 02. මෙහෙවර

### මෙහෙවර

පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයෙහි දැනුම, ආකල්ප හා පර්යේෂණ කුශලතා වර්ධනය කිරීම සඳහා විද්‍යාර්ථීන්ට උපරිම අවස්ථා හා පහසුකම් සැපයීමේ විශිෂ්ටත්වයට ළඟාවීම

### Mission

To achieve excellence in providing learners with the best possible opportunities and facilities to develop knowledge, attitude and research skills in the field of Pali & Buddhist Studies

# 03. ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන ව්‍යුහය

| | |
|---|---|
| 01. කුලපති | ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, මහෝපාධ්‍යාය, පණ්ඩිත, අතිපූජ්‍ය වැලමිටියාවේ ධම්මකිත්ති ශ්‍රී කුසලධම්ම නාහිමිපාණෝ බී.ඒ. ගෞරව (විද්‍යාලංකාර) |
| 02. උපකුලපති | මහාචාර්ය සරත් අමුණුගම මහතා<br>Licence es Lettres (Sorbonne), M.A. (Sorbonne), PhD (Sorbonne), P.G. Dip. (Sorbonne), DESS (Borugogne)<br>(2014.03.19 දින දක්වා)<br><br>මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර මහතා<br>BA (Vidyal.) MA(Shiga)<br>(2014.03.20 දින සිට) |
| 03. අධ්‍යක්ෂ | පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි<br>B.A. (Hons), M.A., PhD |
| 04. ලේඛකාධිකාරී | ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතා<br>බී.එස්සී Pub. Ad (ශ්‍රී ජයවර්ධනපුර), MSSc. (කැලණිය)<br>SATSL.LICA |
| 05. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | රසිකා සුබසිංහ මහත්මිය (සප්තවාර්ෂික හා අධ්‍යයන නිවාඩු)<br>( 2014.12.08 දින දක්වා) |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (වැඩ බලන) | ඩබ්ලිව්.ඩී.ටී. තිලකරත්න මහතා<br>(BSc.) |
| 06. ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | ඒ.පී.එස්.එම්. දොලගේ මහත්මිය<br>B.Sc. Business Admn(Sp) (SJP) |
| 07. ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | එම්.කේ. ගීතානි අත්තනායක මහත්මිය<br>බී.ඒ. ගෞරව, එම්.ඒ (කැලණිය)<br>MLSc. (කොළඹ) |
| 08. සහකාර ලේඛකාධිකාරී | ඩබ්ලිව්.ඩී.ටී. තිලකරත්න මහතා<br>(BSc.) |

## 04. අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේගේ සමාලෝචනය :

### (අ) කෙටි හැඳින්වීම

ආයතනය ආරම්භයේ සිට මේ දක්වා ආයතනය පවත්වා ගෙන යනු ලැබුයේ කුලී ගොඩනැගිලිවලය. 2012/13 වර්ෂවලදී ආයතනය සඳහා ඉඩමක් ලබා ගෙන ගොඩනැගිලි ඉදි කර ගැනීම සඳහා මානෙල්වත්ත විහාර භූමියෙන් දීර්ඝකාලීන බදු මත පවරා ගැනීමට නියමිතව තිබූ අදාළ භූමිභාගය නිරවුල් නොවීම හේතුවෙන් ඉහත වර්ෂ 02 තුළදීම එහි අරමුණු ඉටු කරවා ගැනීමට නොහැකි වීම හේතුවෙන් එම කටයුතු අත්හැර දමන ලදී. නව අධ්‍යක්ෂ වශයෙන් වැඩ බාර ගත් පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි විසින් කරන ලද ආරාධනාවකට අනුව 2013 වර්ෂයේ නොවැම්බර් මාසයේදී උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති ආයතන ප්‍රගති සමාලෝචන රැස්වීමකදී එවකට ආයතනය පිහිටි සුනේත්‍රා මහාදේවී පිරිවෙන් පරිශ්‍රය ජාත්‍යන්තර උසස් අධ්‍යයන ආයතන මට්ටමකට ළඟාවීම සඳහා භෞතික පහසුකම් හා වෙනත් පහසුකම් ප්‍රමාණවත් නොවන බව හා අදාළ ප්‍රමිතීන්ට අනුකූල නොවන බව සාකච්ඡා කිරීමෙන් පසු අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් 2014 වර්ෂයේ සිට කොහුවල, අංක 113 පරිශ්‍රයට ආයතනය ගෙන එන ලදී.

ඒ අනුව නව ගොඩනැගිල්ලට ප්‍රවේශ වීමත් සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය, අංශ ප්‍රධානවරුන්, පර්යේෂණ ඒකකය, පුස්තකාලය යන අංශවලට වඩා පුළුල් හා නවීන පහසුකම් වලින් යුතුව ඉඩ පහසුකම් ලබා දී ඇත. එමෙන් ම උසස් මට්ටමේ, දේශන ශාලා, ශිෂ්‍ය විවේකාගාර, අභිනව පරිගණක විද්‍යාගාරයක් මෙන් ම පරිපාලන අංශ සඳහා ද වැඩි ඉඩකඩ හා පහසුකම් ලබා දී ඇත.

කොරියාවේ ඩොංගුක් විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති හා ආචාර්ය මණ්ඩලය ඇතුළු දූත පිරිසක් පෙබරවාරි මස ආයතනයට පැමිණි අතර එම අවස්ථාවේදී ආයතන දෙකෙහි අධ්‍යයන කටයුතු වැඩි දියුණු කර ගැනීම සඳහා ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. තවද අප්‍රේල් මාසයේදී හොංකොංහි බුද්ධ ධර්ම මධ්‍යස්ථානය, අප ආයතනය මගින් පවත්වන පර්යේෂණ හා ඉගැන්වීම් සඳහා වන පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී.

ආයතනයේ කළමනාකාර මණ්ඩලයේද මහ පෙන්වීම ඇතිව මෙම ආයතනයට පවතින ප්‍රධානතම ගැටළුව වන ස්ථිර ඉඩමක් ලබා ගෙන ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීම සඳහා වන ව්‍යාපෘති යෝජනාවලියක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. ආයතනයේ වර්තමාන කාර්ය සාධනය හා ඉදිරි වර්ෂ 06 සඳහා වන අධ්‍යයන සැලසුම් සලකා බැලූ අදාළ අංශ මෙම ව්‍යාපෘති යෝජනාවලිය අදියර 03කින් ක්‍රියාත්මක වන පරිදි අනුමත කිරීමට කටයුතු යොදන ලදී. මෙහි සැලසුමෙහි අන්තර්ගතය අනුව ප්‍රථම අදියර ප්‍රධාන පරිපාලන හා නේවාසිකාගාර ගොඩනැගිලි වලින් ද, දෙවන අදියර අධ්‍යයනාංශ හා අමතර දේශන ශාලා හා වෙනත් පහසුකම් වලින් ද නේවාසිකාගාර සංකීර්ණයකින් ද සමන්විත වන අතර තුන්වන අදියර ශ්‍රවණාගාර හා විවේකාගාර, නිල නිවාස හා අමතර පහසුකම් වලින් ද විදේශ ශිෂ්‍යයන් සඳහා විශේෂ නිවාස සංකීර්ණයකින්ද යුක්ත වේ.

ඉහත යෝජනාවලිය සඳහා 2014 ඔක්තෝබර් මස ඉදිරිපත් කරන ලෙස 2015 අයවැය යෝජනාවලියේ මිලියන 1000ක මුදලක් අප ආයතනය වෙත වෙන් කර දී ඇති බව ඉතා විශේෂයෙන් සඳහන් කළ යුතු වේ. මෙය ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ කටයුතු මෙන්ම විදේශීය ශිෂ්‍ය නේවාසික පහසුකම වැඩිදියුණු කිරීම පිණිස ගන්නා ලද පියවරක් ලෙස එම අයවැය ප්‍රකාශයේදී ජනාධිපතිතුමා විසින් සඳහන් කරන ලදී. ආයතනයේ වර්ෂ 35ක ඉතිහාසයේ ආයතනය ස්ථිරව ස්ථාපිත කර ගැනීම සඳහා තබන ලද සුවිශේෂී ම පියවර ලෙස මෙය සඳහන් කළ හැකිය.

ආයතනයේ අධ්‍යක්ෂ ඇතුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය නිරන්තරව ආයතනයේ අධ්‍යයන කටයුතු නඟා සිටුවීම සඳහා හා වැඩිදියුණු කර ගැනීම සඳහා වන දේශීය හා විදේශීය සම්මන්ත්‍රණ, වෙනත් අධ්‍යයන වැඩ සටහන් රාශියකට සම්බන්ධ වීමට හැකියාව 2014 වර්ෂය තුළදී ලැබුණි. තවද ඉහත අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික භවතුන් සියලු දෙනා නිරන්තරව පර්යේෂණ කාර්යයන් හි නිරත වේ.

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ මූලාශ්‍රය හා බෞද්ධ සංස්කෘතිය පිළිබඳ උසස් අධ්‍යයන හා පර්යේෂණ සඳහා වෙන් වූ එකම ආයතනයයි. වර්තමානයේ එහි පහත සඳහන් පාඨමාලා හා පර්යේෂණ වැඩසටහන් සිංහල හා ඉංග්‍රීසි යන මාධ්‍ය දෙකෙන්ම ක්‍රියාත්මක වේ.

| Course ID | Course Name | Course Name (in Sinhala) | Exam Name |
|---|---|---|---|
| 01 | Postgraduate Diploma in Buddhist Studies | බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණය |
| 02 | Master of Arts Degree in Buddhist Studies | බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය |
| 03 | Postgraduate Diploma in Pali Studies | පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණය |
| 04 | Master of Arts Degree in Pali Studies | පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය |
| 05 | Master of Philosophy | දර්ශනපති අධ්‍යයන පර්යේෂණ (MPhil.) | දර්ශනපති උපාධි පරීක්ෂණය |
| 06 | Doctor of Philosophy | දර්ශන විශාරද අධ්‍යයන පර්යේෂණ (PhD) | දර්ශන විශාරද උපාධි පරීක්ෂණය |
| 07 | Postgraduate Diploma course in Buddhist Ayurvedic Counselling | බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණය |
| 08 | Master of Arts Degree Course in Buddhist Ayurvedic Counselling | බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව | බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය |
| Extra Course | | | |
| 09 | Basic Pali & Sanskrit Course | | |
| 10 | English Through Buddhism | | |
| 11 | Source Studies, Research Methodology and Logical Thinking | | |

ඉහත සඳහන් පාඨමාලා හා පර්යේෂණ වැඩසටහන් හදාරණ ලද ශිෂ්‍ය සංඛ්‍යා පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ඩිප්ලෝමා | - | 113 |
| ශාස්ත්‍රපති | - | 337 |
| දර්ශනපති | - | 153 |
| දර්ශන විශාරද | - | 84 |
| | | 687 |


මෙම ආයතනය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විශිෂ්ට ස්ථානයකට පත් කරලීම අපගේ පරමාර්ථයයි.

(ආ) ජයග්‍රහණ

පසුගිය වසර පහක කාලය තුළ දී පාඨමාලා සංඛ්‍යාව හා ජාතික ජාත්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය කිරීමෙන් බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ කටයුතු උසස් තත්වයකට පත් කිරීමට අප සමත් වී ඇත.

සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව

| | ජාතික | ජාත්‍යන්තර |
|---|---|---|
| 1. 2009 | 200 | 140 |
| 2. 2010 | 274 | 116 |
| 3. 2011 | 206 | 141 |
| 4. 2012 | 164 | 133 |
| 5. 2013 | 186 | 134 |
| 6. 2014 | 285 | 128 |



## (ඇ) පසුබෑසීම් හා සාධාරණීකරණය.

මෙම ආයතනයට වසර තිස් පහකට අධික ඉතිහාසයකට හිමිකම් ඇතත් මේ දක්වා ඊට ස්ථිර භූමිභාගයක් හෝ ගොඩනැගිල්ලක් ලබා ගැනීමට හැකි වී නොමැත. මෙතෙක් මෙම ආයතනය පවත්වා ඇත්තේ කුලියට ලබා ගත් ගොඩනැගිලිවලය. නව අධ්‍යක්ෂ පූජ්‍ය මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි ආයතනයට පත්වීම සමඟ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා ජාතික අයවැය දෙපාර්තමේන්තුව, කළමනාකාර මණ්ඩල සාමාජික භවතුන් හා ආයතනයේ අදාළ බලධාරීන් මෙම ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට ගත් අඛණ්ඩ උත්සාහවල ප්‍රතිඵලයක් ලෙස සාර්ථක මට්ටමකට ළඟා වී ඇති බැවින් දැනට ඇති භෞතික සම්පත් ගැටළු බොහෝමයකට විසඳුම් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ නවීන ඉඩපහසුකම් මදිකම ශිෂ්‍ය ආකර්ෂණය අඩුවීමට හේතුවක් වී ඇත. ආයතනයේ අනාගත සංවර්ධනය කෙරෙහි මෙම ගැටළුව ඉතා අයහපත් ලෙස බලපාන බව සඳහන් කළ යුතුය. වැඩිම විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉගෙනුම ලබන මෙම ආයතනයෙහි නේවාසික පහසුකම නොමැතිවීම හේතුවෙන් විදේශීය ශිෂ්‍යයන් සැලකිය යුතු ප්‍රමාණයක් අහිමි වීමද සැලකිය යුත්තකි.

## (ඈ) අනාගත සැලසුම්.

1. ආයතනයට ස්ථිර ඉඩමක් හා ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය කරන ව්‍යාපෘති වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ ඇතුළු අංශ ප්‍රධානවරුන්ගේ හා සියලු කාර්ය මණ්ඩල වල දායකත්වයෙන් සකස් කර ඉදිරිපත් කරන ලදුව, එය ජාතික අයවැය දෙපාර්මේන්තුවෙන් අනුමත වී 2014 අයවැයෙන් රු.මිලියන 1000ක් අනුමත වී ඇති අතර ප්‍රථම කාර්යය ලෙස ආයතනයට ඉඩමක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉටු කරවා ගැනීමට අවශ්‍ය අනුමැතිය ලැබී ඇති අතර හඳුනාගත් ඉඩමක් අදාළ පවරා ගැනීම් මගින් ආයතනය සතු කර ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.

   ථෙරවාද බෞද්ධ අධ්‍යයනය වඩා ප්‍රචලිත කිරීම සඳහා හොංකොං හි බෞද්ධ අධ්‍යයන පර්යේෂණ පාඨමාලා ආරම්භ කිරීම පිණිස අවබෝධතා ගිවිසුම අනුව එරට අධ්‍යයන දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබීමට නියමිතය. දැනට සිංගප්පූරුවේ පවත්වනු ලබන පාඨමාලා සඳහා වඩා විධිමත් පරිදි කටයුතු කිරීමට නව අවබෝධතා ගිවිසුමකට එළඹීමට නියමිතය.

2. දැනට කටයුතු අවසන් මට්ටමේ පවතින බෞද්ධ සන්නිවේදනය හා බුදුදහම හා නීතිය පිළිබඳ පාඨමාලා දෙකක් යථාකාලයේදී හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

## (ඉ) වෘත්තීය අවස්ථා

පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂෙත්‍රයේ වෘත්තීය අවස්ථා රාශියක්ද ශ්‍රී ලංකාවේ පවතී. කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලයන්හි පාලි හා බෞද්ධ අධ්‍යයන අංශ ක්‍රියාත්මක වේ. අනුරාධපුර බුද්ධශ්‍රාවක විශ්වවිද්‍යාලය හා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පාලි හා බෞද්ධ අධ්‍යයන සඳහාම වෙන් වූ විශ්වවිද්‍යාල දෙකකි. පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය ද එම විෂය ක්ෂේත්‍රය සඳහාම වෙන් වූ ආයතනයකි. තව ද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පිරිවෙන්වල ප්‍රධාන විෂයධාරාව වනුයේ පාලි හා බෞද්ධ අධ්‍යයනයන්ය. ශ්‍රී ලංකාවේ පාසල්වල බුද්ධධර්මය හා බෞද්ධ සංස්කෘතිය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව විසිදහසකට ආසන්නය. ඉහත සඳහන් විශ්වවිද්‍යාල, ආයතන හා පාඨශාලාවන්හි අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සඳහා ආචාර්යවරුන් විශාල සංඛ්‍යාවක් අවශ්‍ය වේ. අප ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති, දර්ශනපති හා දර්ශන විශාරද පාඨමාලා සම්පූර්ණ කරන ලද භික්ෂූන් වහන්සේලා හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් රාශියක් ඉහත සඳහන් ආයතනවල අධ්‍යාපන, පර්යේෂණ කටයුතු වල යෙදී සිටිති.

මේ හැරුණු විට වර්තමාන ලෝකයේ ධර්ම ප්‍රචාරය සඳහා විශාල වශයෙන් භික්ෂූන් වහන්සේලා අවශ්‍ය වී ඇත. අප ආයතනයේ පාඨමාලා අවසන් කළ දේශීය හා විදේශීය භික්ෂූන් වහන්සේලා රාශියක් විදේශ රටවල හා උසස් අධ්‍යාපන ආයතනවල ඉගැන්වීම් කටයුතු හා පර්යේෂණ කටයුතුවල ද ථෙරවාද බුදුදහම පිළිබඳ ධර්ම ප්‍රචාරයේ ද යෙදී සිටිති.

හොංකොං විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන අංශයෙහි ප්‍රධාන හා වර්තමාන බුද්ධ ධර්ම ආයතනයේ අධ්‍යක්ෂ ධූරය දරනුයේ ද මෙම ආයතනයේ ආචාර්ය උපාධිය හැදෑරූ මෙහි බෞද්ධ මූලාශ්‍රය අංශාධිපති වශයෙන් කලක් කටයුතු කළ ස්වාමීන් වහන්සේ නමකි. ලෝක විශ්වවිද්‍යාල සංගමයේ ලේඛකාධිකාරී හා ඔක්ස්පර්ඩ් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමේ කටයුතු වල යෙදෙන ආචාර්ය කම්මායිධම්මසාමි හිමියෝද මෙහි ආචාර්ය උපාධිය හදාළ කෙනෙකි. කාම්බෝජයේ විශ්වවිද්‍යාලයක ප්‍රධාන විධායක නිලයක් දරනුයේ අප ආයතනයේ අධ්‍යයන කටයුතු සිදු කළ හිමි නමකි. තව ද ලෝකයේ බෞද්ධ ආයතන රැසක අප ආයතනයේ පශ්චාත් උපාධි ලබාගත් ශිෂ්‍ය හිමිවරු සේවය කරති. මේ අයුරින් සලකා බලන විට අප අධ්‍යයන ආයතනයේ පාඨමාලා සම්පූර්ණ කරන සියලු දෙනාටම රැකියා අවස්ථා රාශියක් දේශීයව හා දේශාන්තරව පවතින බව සඳහන් කළ හැකිය.

මෙම ආයතනය පශ්චාත් උපාධි ආයතනයක් නිසා බොහෝ විට ලියාපදිංචි වී සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහෝ දෙනෙක් රැකියා වල නිරත වූ අය වෙති. ඔවුහු ඔවුන්ගේ උසස්වීම් සඳහා මෙහිදී පශ්චාත් උපාධි හදාරන අය වෙති.එමෙන්ම තවත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසක් රැකියාවෙන් පසු විශ්‍රාම ලබා බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ඇති නැඹුරුව හා උනන්දුව හේතුවෙන් එම ක්ෂෙත්‍රයෙහි තම දැනුම වර්ධනය කර ගැනීම සඳහා අප ආයතනයේ උසස් උපාධි පාඨමාලා හදාරති. එමනිසා රැකියා පිළිබඳ ගැටලුවක් මෙම උපාධිධාරීන් සම්බන්ධයෙන් උද්ගත නොවන බව සඳහන් කළ යුතුය.

# 05. සම්පත් හා ශිෂ්‍ය සංඛ්‍යා ලේඛනය - 2014

| පාඨමාලාව | ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 11 | ස්ථිර කාර්ය මණ්ඩලය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ii - 04<br>විද්‍යාත්මක සහකාර - 02 |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 29 | |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 125 | |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 175 | |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 12 | |
| බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 65 | |
| බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 25 | |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 81 | |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 72 | |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව (සිංහල මාධ්‍යය) | 46 | |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය) | 38 | |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව- බාහිර ( ඉංග්‍රීසි මාධ්‍යය) | 08 | |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව- බාහිර | | |
| එකතුව | 687 | |

## 06. පාඨමාලාව සම්පූර්ණ කළ දේශීය ශිෂ්‍යයෝ - 2014

| පාඨමාලාව | මාධ්‍යය | විභාගයට පෙනී සිටි (2013) | 2014 වර්ෂයේ විභාගයට පෙනී සිටි (2014) |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | සිංහල | 09 | 08 |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | 02 | 06 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල | 134 | 91 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි | 10 | 07 |
| පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල | 10 | 10 |
| බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | සිංහල | 10 | 50 |
| බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව | සිංහල | 19 | 20 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | සිංහල | 02 | -- |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | ඉංග්‍රීසි | -- | -- |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | සිංහල | 05 | -- |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | ඉංග්‍රීසි | 06 | 03 |
| | | 207 | 195 |

## 07. පාඨමාලාව සම්පූර්ණ කළ විදේශීය ශිෂ්‍යයෝ - 2014

| පාඨමාලාව | මාධ්‍යය | විභාගයට පෙනී සිටි (2013) | 2014වර්ෂයේ විභාගයට පෙනී සිටි (2014) |
|---|---|---|---|
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | 08 | 19 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව | ඉංග්‍රීසි | 167 | 152 |
| බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව | ඉංග්‍රීසි | -- | -- |
| බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව | ඉංග්‍රීසි | 06 | 01 |
| බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව- බාහිර | ඉංග්‍රීසි | 03 | 08 |
| බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව- බාහිර | ඉංග්‍රීසි | 05 | -- |
| | | 205 | 172 |

## 08. අධ්‍යයන කාර්ය මණ්ඩලය - 2014

| දෙපාර්තමේන්තුව | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | විද්‍යාත්මක සහකාර ii ශ්‍රේණිය |
|---|---|---|---|---|---|---|
| බෞද්ධ දර්ශනය අධ්‍යයන අංශය | සිංහල ඉංග්‍රීසි | - | - | 01 | - | - |
| බෞද්ධ සංස්කෘති අධ්‍යයන අංශය | සිංහල ඉංග්‍රීසි | - | - | 02 | - | - |
| බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයන අංශය | සිංහල ඉංග්‍රීසි | - | - | 01 | - | - |
| පර්යේෂණ අංශය | සිංහල ඉංග්‍රීසි | - | - | - | - | 02 |
| එකතුව | | - | - | 04 | - | 02 |

# 09. පරිපාලන කාර්ය මණ්ඩල විස්තර - 2014

| පීඨය/අංශය | අංශ ප්‍රධාන | කාර්ය මණ්ඩලය | කණිෂ්ඨ කාර්ය මණ්ඩලය |
|---|---|---|---|
| අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ - 01 | ලිපිකරු iii ශ්‍රේණිය - 01 | -- |
| පාලන අංශය | *ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - 01 (අධ්‍යයන නිවාඩු) | *ලඝුලේඛක (සිංහල) i ශ්‍රේණිය - 01<br>*ලිපිකරු iii ශ්‍රේණිය - 02 | *රියදුරු ii ශ්‍රේණිය -02<br>*කම්කරු(විශේෂ ශ්‍රේණිය ) - 02<br>කම්කරු (iii ශ්‍රේණිය) – 01<br>*කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු - 01 |
| ගිණුම් අංශය | * ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී - 01 | *ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (ලිපිකරු) - 01<br>*ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (පොත් තබන්නා) - 01<br>*සරප් මාණ්ඩලික සහකාර - 01<br>ගබඩා භාරකරු iii ශ්‍රේණිය - 01 | |
| පුස්තකාලය | *ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී - 01 | *පුස්තකාල සහකාර iii ශ්‍රේණිය - 02 | *පුස්තකාල සේවක ii ශ්‍රේණිය - 02 |
| විභාග හා ශිෂ්‍ය කටයුතු අංශය | *සහකාර ලේඛකාධිකාරී - 01 | *පරිගණක යෙදුම් සහකාර iii ශ්‍රේණිය- 02 | |
| එකතුව | 04 | 12 | 07 |

## 10. පර්යේෂණ, නව සම්පාදන සහ ප්‍රකාශන :

2014 වර්ෂයේදී ප්‍රදානය කරන ලද පර්යේෂණ උපාධි

දර්ශන විශාරද උපාධිය(සිංහල මාධ්‍යය)

| නම | උපාධිය | පර්යේෂණ උපාධි මාතෘකාව | අපේක්ෂකයාගේ රට |
|---|---|---|---|
| Mr. Russell Bowden | දර්ශන විශාරද | The Dhamma's Transmission and the Pali Theravada Canon: An Examination of the Processes and Supporting Literature –from the Third Buddhist Council to King Parakramabahu's Unification of the Sri Lanka Sāngha. | එක්සත් රාජධානිය |
| Rev. Kotavila Sri Pemaloka | දර්ශන විශාරද | Duties and Responsibilities of Early Buddhist Monastic Order. | ශ්‍රී ලංකාව |
| Mr. P.D.Sumith De Silva | දර්ශන විශාරද | An Analytical Study of the Buddhist Critique of the Attachment to Concepts. | ශ්‍රී ලංකාව |
| Mrs. Geethi Karunarathna | දර්ශන විශාරද | A Critical Study of the Psychological, Ethical and Social Basis of the Buddhist Theory of Karma | ශ්‍රී ලංකාව |

## 11. වැඩසටහන්, දේශන හා වැඩමුළු :

ආචාර්ය පී.ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/අධ්‍යයනාංශ ප්‍රධාන-බෞද්ධ සංස්කෘති අධ්‍යයන අංශය)

(01) පර්යේෂණ ලිපි

i. බෞද්ධ මනෝරෝග චිකිත්සාවේ මූලිකාංග, සංස්. ආචාර්ය ගොඩගම මංගල හිමි, ඇන්.ගොඩගේ සහ සහෝදරයෝ, 2014

ii. දසරාජ ධර්මයෙහි විග්‍රහවන දානය, නිවන්මග රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව, 2014

iii. Cultural bound Syndrome - අන්වේෂණා - 2014

iv. බෞද්ධ මනෝ රෝග චිකිත්සාව හා බුදුදහම - අන්වේෂණා - 2014

(02) 2014 වර්ෂය තුළ අධීක්ෂණය කොට නිමාකළ දර්ශනශූරි උපාධි නිබන්ධ

i. Counseling for Interpersonal conflict, A Psychological model Based on Buddhsit Principles :- Soma de Silva

ii. A Critical Study of Buddhist Methods of Meditation with reference to the planning for Human Capacity Building :- Mallika Karunarathna

iii. An Analyticity Study of the pre-requisites for Buddhist Meditation :- Rathnasiri Rathnayaka

iv. ශ්‍රී ලංකාවේ දේශපාලන භාවිතය විෂයෙහි බලපෑ බෞද්ධ සංස්කෘතික සාරධර්ම පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක් :- D.N.D.G. ඕපාත

v. රෝම ලන්දේසි දිළික්ත නීතියෙන් පැනෙන අවධානීය යුතුකම බෞද්ධ දර්ශනයෙන් විග්‍රහ වන අයුරු :- නාමල් බලල්ලේ

(03) පරිපාලන දායකත්වය - 2014

i. වැඩ බලන අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කිරීම

ii. අංශාධිපති, බෞද්ධ සංස්කෘතික අධ්‍යයනාංශය

iii. පීඨ මණ්ඩල සාමාජික - පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

iv. කළමනාකාර මණ්ඩල සාමාජික - පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

v. සනාතන සභා මණ්ඩල සාමාජික - කැලණිය විශ්වවිද්‍යාලය

vi. විදේශ සිසුන් සඳහා වන ජනාධිපති ශිෂ්‍යත්ව වැඩ සටහන - සම්බන්ධීකාරක, බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

vii. සම්බන්ධීකාරක - බෞද්ධායුර්වේද පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

viii. සම්බන්ධීකාරක - බෞද්ධායුර්වේද ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

ix. සාමාජික - විෂයමාලා අධ්‍යයන හා ඉගැන්වීම් ඇගයීමේ කමිටුව (CULTEC)

x. සාමාජික - පශ්චාත් උපාධි අධ්‍යයන කමිටු රැස්වීම , කැලණිය විශ්වවිද්‍යාලය

(04) <u>ආරාධිත දේශන - 2014</u>

i. බෞද්ධ සංස්කෘතිය පිළිබඳ ආරාධිත කථිකාචාර්ය - කැලණිය විශ්වවිද්‍යාලය පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

ii. බෞද්ධ උපදේශනය පිළිබඳ ආරාධිත කථිකාචාර්ය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

iii. බෞද්ධ මනෝවිද්‍යාව පිළිබඳ ආරාධිත කථිකාචාර්ය - බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය බෞද්ධ දර්ශන අධ්‍යයනාංශය

iv. බෞද්ධ කළමනාකරණය පිළිබඳ ආරාධිත දේශනය ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

(05) <u>නව විෂය නිර්දේශ හඳුන්වාදීම</u>

i. Certificate Course in Buddhist Counseling Buddhist Library – Singapore

(06) <u>දේශන පැවැත්වීම - පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය - 2014</u>

<u>ශාස්ත්‍රපති පාඨමාලාව</u>

i. බෞද්ධ මනෝරෝග චිකිත්සාව - ශා 26

ii. Buddhist Psychotherapy – ME 26

iii. බුදුසමයේ සමාජ ප්‍රස්තරය - ශා 27

iv. Social Dimension of Buddhism – ME 27

(07) දේශන පැවැත්වීම - පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය - 2014

පශ්චාත් උපාධි ඩිප්ලෝමා

i. බෞද්ධ සංස්කෘතිය සමාලෝචනාත්මක අධ්‍යයනයක් - ඩී 04

ii. Buddhist Culture A Historical Study –DE 04

(08) බෞද්ධායුර්වේද උපදේශන ඩිප්ලෝමා

i. මනෝකායික ගැටලු පිළිබඳ බෞද්ධ උපදේශන ක්‍රමය -පීඩීබීසී

(09) බෞද්ධායුර්වේද උපදේශන ඩිප්ලෝමා

i. බෞද්ධ මනෝ චිකිත්සාව - ශා 03

ඩබ්ලිව්.එම්.දේශප්‍රිය ගුණසේන මහතා
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / අධ්‍යයනාංශ ප්‍රධාන - බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයන අංශය)

ශාස්ත්‍රීය පර්යේෂණ ලිපි :

1. පාලි භාෂාවෙහි ප්‍රභවය හෙවත් ජන්ම භූමිය පිළිබඳ සාම්ප්‍රදායික හා මතවාද සමාලෝචනය
බෞද්ධ හා පාලි අධ්‍යයන, අති පූජ්‍ය පලිපාන ශ්‍රී චන්ද්‍රානන්ද මහානායක මාහිමි ජන්ම ශත සංවත්සර අනුස්මරණ ශාස්ත්‍රීය සංග්‍රහය, එස්.ගොඩගේ ප්‍රකාශනය, 2014

2. අති පූජ්‍යහේන්පිටගෙදර ඤාණසීහ නාහිමි : බුදුසමයේ නිකායන්තර හා භාෂාන්තර ඥාන පටුත්වය
ඤාණෝපායිනී, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ 150 වන සංවත්සර ශාස්ත්‍රීය සංග්‍රහය, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු ප්‍රකාශනය, 2014

3. ථෙරවාද සම්ප්‍රදායයේ මාධ්‍ය භාෂාව, ඤාණෝපායිනී,

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු ප්‍රකාශනය, 2014

4. භාරතීය බුදුසමයේ ජාත්‍යන්තර ව්‍යාප්තිය,

ආසියාවේ බෞද්ධ සංස්කෘතිය, ශ්‍රී දම්රජ පිරිවෙන් ප්‍රකාශනය, 2014

5. ත්‍රිපිටක පාලියේ ව්‍යාඛ්‍යාන යෙදුම්,

බුද්ධි ප්‍රභා, පූජ්‍ය වටගෙදර විමලබුද්ධි අනුනාහිමි අභිස්තුති ශාස්ත්‍රීය සංග්‍රහය, පඤ්ඤෝදය ශිෂ්‍ය සමිතියේ ප්‍රකාශනය, 2014

6. අර්ථ විවරණ ක්‍රමයෙහි ප්‍රභවය, ඤාණකිත්ති සම්භාවනා ශාස්ත්‍රීය සංග්‍රහය, 2014

7. බෞද්ධ ශ්‍රාවක ශ්‍රාවිකා චරිත හා සබැඳි බෞද්ධ පෙරහැර. ලක්දිව බෞද්ධ පෙරහැර, ගම්පහ වෛශාඛ තෙමහල් මහ පෙරහැර සමිතියේ ප්‍රකාශනය, 2014

8. කඨින දානය නිවන්මග ශාස්ත්‍රීය සංග්‍රහය, රජයේ මුද්‍රණාලය බෞද්ධ සංගමයේ ප්‍රකාශනය, 2014

9. The Six Contemporary Teachers of the Buddhist ; Pravacana, 2014

10. පාලි භාෂාවේ ක්‍රියාරූප කෙරෙහි සංස්කෘත බලපෑම, නැණස වාර්ෂික ශාස්ත්‍රීය සංග්‍රහය, මහාවිහාර මහ පිරිවෙන් ප්‍රකාශනය, 2014

11. පශ්චාත් පේටක ප්‍රාග් අට්ඨකථා යුගයේ පාලි සාහිත්‍යය, ඥානවිලාසී ශාස්ත්‍රීය සංග්‍රහය, 2014

2014 වර්ෂයේ අධීක්ෂණය කළ පර්යේෂණ උපාධි

දර්ශනපති උපාධිය

1. කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලයෙහි ථේරවාද බෞද්ධ දර්ශනය නියෝජනය වන පුස්කොළ අත් පිටපත් පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්, නිලන්ත ඉන්දික හෙට්ටිගේ මහතා
2. ලෝක විභාගය පිළිබඳ ථේරවාද හා නූතන ඉගැන්වීම් : තුලනාත්මක අධ්‍යයනයක්, තිළිණ රණසිංහ මහතා

දර්ශන විශාරද උපාධිය

1. ධාර්මික සංකල්පය අතීත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (අනුරාධපුර - පොළොන්නරුව යුග ඇසුරෙන්) මල්ලිකා දළුවත්ත මහත්මිය

ආයතන පරිපාලනය සඳහා දායකත්වය

1. වැඩ බලන අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීම.
2. බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන ලෙස කටයුතු කිරීම.
3. පීය මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කිරීම.
4. කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කිරීම.
5. දර්ශන විශාරද හා දර්ශනපති උපාධි නිබන්ධ පරීක්ෂක ලෙස කටයුතු කිරීම.
6. පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාවේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීම.
7. අන්වේෂණ ශාස්ත්‍රීය සංග්‍රහයේ සංස්කාරවරයකු ලෙස කටයුතු කිරීම.

උපාධි පාඨමාලාවන්හි දේශන පැවැත්වීම.

1. බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව.

i. ශා:01 - පාලි නිකායාගත බෞද්ධ චින්තනය, විග්‍රහය හා විවරණය
ii. ශා: 06 - මහායාන බුදුසමයේ ප්‍රභවය හා මහායාන සූත්‍ර සාහිත්‍යය
iii. ශා: 09 - විනය හා ආරාමික සංවිධානය
iv. ශා: 35 - ථේරවාද සම්ප්‍රදාය, ඉතිහාසය හා ධර්ම කරුණු පිළිබඳ අධ්‍යයනයක්

2. පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව.
   i. MPS : 01 - නිර්දිෂ්ට ග්‍රන්ථ 01 - ත්‍රිපිටක පාලි සාහිත්‍යය
   ii. MPS : 04 - පාලි සාහිත්‍යය ඉතිහාසය

3. බෞද්ධ ආයුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව
   i. උශා 02 - බෞද්ධ පෞරුෂත්ව විශ්ලේෂණය

<u>වෙනත් ආයතනවලට ලබා දෙන දායකත්වය</u>

1. කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
2. ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ යාවජීව සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
3. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ දහම් පාසැල් පෙළ පොත් සංස්කාරක මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ක්‍රියා කිරීම.
4. විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රශ්න පත්‍ර සකස් කිරීම, ප්‍රමිත කිරීම ආදියෙහි සම්පත් දායකයකු ලෙස කටයුතු කිරීම.
5. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනසූරි උපාධි නිබන්ධ පරීක්ෂකවරයකු ලෙස කටයුතු කිරීම.
6. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ දර්ශන විශාරද හා ශාස්ත්‍රපති උපාධි නිබන්ධ පරීක්ෂකවරයකු ලෙස කටයුතු කිරීම.

පූජ්‍ය රළුවේ පද්මසිරි හිමි
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - බෞද්ධ දර්ශන අධ්‍යයන අංශය)

ACADEMIC APPOINTMENTS

i. Reviewer, 2nd International Buddhist Conference on International Exchange of Buddhism in the Global Context, SIBA, Kandy, Sri Lanka. 04th September 2014,

ii. Research Person of Review Panel, International Research Conference on Humanities & Social Sciences, Faculty of Humanities & Social Sciences, University of Sri Jayewardhanapura, Sri Lanka, 2014.

iii. Visiting Lecturer, Department of Pali & Buddhist Studies, University of Kelaniya, Sri Lanka, 2014.

iv. Visiting Lecturer, Postgraduate Course of Sociology, University of Kelaniya, Sri Lanka, 2014.

v. Visiting Lecturer, Dept. of Buddhist Philosophy, Buddhist & Pali University of Sri Lanka, Homagama, Sri Lanka, 2014.

vi. Head, Department of Buddhist Philosophy, Postgraduate Institute of Pali & Buddhist Studies, University of Kelaniya, Sri Lanka, since 07th May 2014 to now

## Academic Performances

a. Sinhala Medium

Book

i. Nanopayini: Symposium in Celebration of 150the Anniversary of Sri Lanka Ramanna Maha Nikaya, co-editor with Ariyawimala, Taldena, Colombo 08: Department of Government Printing. 2014.

ii. Patipada: 69th Anniversary Article Collection of Ramanna Maha Nikaya, Assistant Editor, Colombo 08: Department of Government Printing. 2014.

Academic Articles:

In Sinhala Medium

i. *Malaysian Vesak Procession (Perahera),* Lakdiwa Bouddha Perahera: Article Collection, Mahinda Ven, Unuwaturabubule & others (ed), Gampaha: Jatyantara Sama Viharaya, 2014. Pp.129-142

ii. Sanghika Dana, Nivan Maga: Article Collection of Buddhist Society of State Press, Gunatilake, H. M. (ed), Colombo 08: Government Printing Department, 2014. Pp. 10-20

iii. An Investigation of Four Buddhist Indicators (*mahapadesa*) as a Sufficient Criteria to Understand Dhamma-Vinaya, Bauddha Adyana ha Pali Adhyana: Birth Centenary Commemorative Academic Volume of Ven. Palipane Chandananda, Madipola Wimalajoti (ed), Colombo 10: S. GOdage & Brothers (pvt) Ltd, 2014.

Translations of Articles from English to Sinhalese:

i. Translations of "The Buddhist Attitudes to Other Religions", by K. N. Jayatilleke, in Viduruwana: 45th Academic Volume of Vidyaratna Pirivena, Sobhita, Madurawlala et al., Colombo 10: S. Godage & Brothers, 2014. Pp. 255-275

*Articles in English*

i. Possibility and Logicality of Having "*hitacchanda*" in an emancipated personality, Anveshana: Journal Of PGIPBS, Postgraduate Institute of Pali & Buddhist Studies, 2014.

ii. "'*Hitacchanda*' as a Possible Drive to Alter Negative Attitudes towards Others", International Council for the Day of Vesak : 10th UNITED NATIONS DAY OF VESAK - 2014, Tu, Thich Nhat and Thien, Thic Duc (ed), Vietnam Buddhist University Series, 2014

iii. A Reflection on Theravada Position of Minor & Least Significant Precepts (Khuddhanukhuddaka), National Conference, Sri Lanka Bhiksu University, Anuradhapura, on the 08th November 2014.

iv. "'*Hitacchanda*' as a Possible Drive to Alter Negative Attitudes towards Others", International Council for the Day of Vesak : 10th UNITED NATIONS DAY OF VESAK - 2014, Vietnam (http://www.iabu.org/node/224)

v. An Investigation on Ethical and Philosophical Issues of the Dialogue between the Buddha and Vassakara, Seventh Research Conference, The Royal Asiatic Society of Sri Lanka, Sri Lanka, 2014.

News Paper Articles in Sinhalese Medium:

Is Driving License of Bhikkhu a Luxurious Item? Divaina (A daily News Paper in Sri Lanka), 29th Wednesday, May 2014.

Driving License of Buddhist Monks and ultra-traditionalist Backwardness, Divaina (A daily News Paper in Sri Lanka), 30th Wednesday, April 2014. (http://www.divaina.com/2014/04/30/badada01.html)

PROFESSIONAL AFFILIATIONS

i. Acting Director, Postgraduate Institute of Pali & Buddhist Studies of University of Kelaniya, Sri Lanka, (12.11.2014 – 19.11.2014, 23.11.2014 – 27.11.2014)

ii. Coordinator of syllabus Preparation Committee of Postgraduate Diploma Course in Buddhism and Jurisprudence, Postgraduate Institute of Pali & Buddhist Studies, of University of Kelaniya, 2014.

iii. Coordinator of Postgraduate Courses in Buddhist Studies (Sinhala Medium), Postgraduate Institute of Pali & Buddhist Studies, of University of Kelaniya, 2014.

iv. Member of the Faculty Board, Postgraduate Institute of Pali & Buddhist Studies, of University of Kelaniya,

v. Member of Management Board, Postgraduate Institute of Pali & Buddhist Studies, of University of Kelaniya, May 2014 to now

vi. Member of Senate, University of Kelaniya, May 2014 to now

Chief Examiner for Buddhist Civilization, A/L Paper Marking, Examination Department of Sri Lanka, Colombo. Examining Center at Royal College, Kurunegala, 2013, Lakdas College Kurunegala-2014.

<u>පූජ්‍ය මිරිස්වත්තේ විමලඥාණ හිමි</u>
<u>(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - බෞද්ධ සංස්කෘති අධ්‍යයන අංශය)</u>

Research Papers Presented

(in English)

- ✓ 'What Did Dhammasaṅgaṇī Mean?', at National Conference on Multy Disciplinary Approaches for the Enhancement of Buddhism in Sri Lanka organized by Sri Lanka Bhiksu University, Sri Lanka in 2014.

(In Pali)

- ✓ 'Vijjodaya Pariveṇe Paṭhamārambhako Siri Sumaṅgala Yatissaro' in the First International Pali conference (in Pali) in the Shan State Myanmar organized by Shan State Sangha Council at Veluwan Monastery, Taunggyi, Shan State Myanmar in 2014.
- ✓ 'Desantara-Pālibhāsā-sammantaṇāni: Ito kuttha', at the International Buddhist Conference on International Exchange of Buddhism in the Global Contexts organized by Sri Lanka International Buddhist Academi in 2014 (September).

Research Paper Moderating in Academic Seminars

1. Chairing an Academic Session in Pali Medium in the International Buddhist Conference on International Exchange of Buddhism in the Global Contexts organized by Sri Lanka International Buddhist Academi in 2014 (September).
2. Charing an Acacademic Session in Pali Medium in the Sāmatthiyadīpakaṃ-Peradeniya University Pali Day Conference organised by the Department of Pali and Buddhist Studies on July 14, 2014

Article Published

(In Sinhala)

- ✓ 'Tibet Buddhist Literature', Buddhist Culture in Asia: Essays in Honour of Most Venerabl Warayaye Athula Thero (Ed. Ven. Dr.Panahaduwe Yasassi and K.A. Weerasena), Sri Damaraja Pirivena, 2014.
- ✓ 'Mahiyangana Perahera and Religious Co-existence Manifested in the Vädi Perahära', Lakdiva Bauddha Perahera (Ed. Ven. Dr. Unuwaturabubule Mahinda et al), International Sama Mahavihara, 2014.
- ✓ 'A Brief Explanation of the Development of Sarvastivada Abhidharma', Buddhist and Pali Studies: Symposium of 100th Year Birth Anniersary of Most Venerable Palipana Sri Chandananda Mahanayaka Thera (Ed. Ven. Dr. Godagama Mangala), Godage International (Pvt) Ltd, Maradana, 2014.
- ✓ 'Dāna: Approach of Christian and Islamic Religions', Nivanmaga (Dānaya), Department of Printing of Government of Sri Lanka, 2014

(In Pali)

- ✓ 'Vijjodaya Pariveṇe Paṭhamārambhako Siri Sumaṅgala Yatissaro', Theravāda Buddhasāsanasobhanā: Pali Papers Presented at the First International Pali Conference in the Shan State Myanmar organized by Shan State Sangha Council at Veluwan Monastery, Taunggyi, Shan State Myanmar in 2014.

Book Reviews

1. Arahant Mahinda: Redactor of Buddhapūjāva in Sinhala Buddhism (With Pali Text, Translation and Analysis)', Ñāṇopāyinī: Symposium Celebrating 150th Anniversary of Sri Lanka Rāmañña Mahā Nikāya (Ed. Ven. Taldena Ariyawimala and Ven. Raluwe Padmasiri), Sri Lanka Rāmañña Mahā Nikāya, 2014.

Dissemination of Knowledge

(Presentation/ Talks)

- ✓ Key-note Speach in the First International Pali conference (in Pali) in the Shan State Myanmar organized by Shan State Sangha Council at Veluwan Monastery, Taunggyi, Shan State Myanmar in 2014

Other

- ✓ Abstract Reviewer for the International Research Conference on Humanities and Social Sciences - 2014 organized by the Faculty of Humanities and Social Sciences of the University of Sri Jayewardenepura, Sri Lanka.

## පර්යේෂණ ඒකකය
## පූජ්‍ය මඩිහේ සුගතසිරි හිමි
## විද්‍යාත්මක සහකාර

01. දර්ශනපති සහ ආචාර්ය උපාධි පර්යේෂන නිබන්ධ පිළිබඳ පරීක්ෂකවරුන් විසින් යෝජිත සංශෝධන අපේක්ෂකයින් විසින් නිවැරදිව සිදු කරන ලද දැයි පරීක්ෂා කර බලා අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේ වෙත වාර්තා කිරීම.
02. ශාස්ත්‍රපති බෞද්ධ අධ්‍යයන හා පාලි පාඨමාලාවල දේශන පැවැත්වීම.
03. ශාස්ත්‍රපති සහ පර්යේෂණ ශිෂ්‍යයින් වෙනුවෙන් පවත්වන ලද පාලි පාඨමාලාවේ දේශන පැවැත්වීම.
04. පර්යේෂණ අධ්‍යයනයන්හි නිරතව සිටින ශිෂ්‍යයින් වෙනුවෙන් පර්යේෂණ ක්‍රමවේදය සම්බන්ධයෙන් විශේෂ සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කිරීම.
05. දර්ශනපති සහ ආචාර්ය උපාධි අපේක්ෂකයින් විසින් ස්වකීය පාඨමාලා අවශ්‍යතා සම්පූර්ණ කරනු පිණිස පවත්වනු ලබන සංක්ෂිප්ත දේශන (Prsentation)වලට සහභාගි වීම සහ අවස්ථාවෝචිත පරිදි ඒවා මෙහෙයවීම.
06. ආයතනය විසින් නිකුත් කරනු ලබන 'අන්වේෂණ' ශාස්ත්‍රීය සංග්‍රහයේ හතරවන කලාපය සංස්කරණය කිරීමේ කටයුතුවල නිරතවීම, එය මුද්‍රණය කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සහ එහි සෝදුපත් පරීක්ෂා කිරීමේ කාර්යයෙහි නිරතවීම.
07. පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණවල අදාළ විෂයයන් සඳහා ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම සහ ඒවායේ පිළිතුරු පත් ඇගයුම් කිරීම.
08. ආයතනය විසින් පවත්වනු ලබන විභාග සම්බන්ධ අධීක්ෂණ කටයුතුවල නිරතවීම.
09. පොදුවේ පර්යේෂණ ශිෂ්‍යයින්ට ස්වකීය පර්යේෂණ කටයුතු කර ගෙන යාම සඳහා අධ්‍යක්ෂ හිමියන්ගේ උපදෙස් පරිදි අවස්ථෝචිතව සහය වීම.
10. විෂයමාලා සංශෝධන කමිටුව සඳහා සහභාගි වීම.
11. ශිෂ්‍ය නියමාවලි සංශෝධන කමිටුව සඳහා සහභාගි වීම.
12. ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා සහභාගි වීම.
13. ආරාධිත දේශන සංවිධානය කිරීම.
14. පාඨමාලා සඳහා නියමිත දේශකවරු නො පැමිණෙන අවස්ථාවල දී එම දේශන ආවරණය කිරීම.
15. අධ්‍යක්ෂ හිමියන් විසින් වරින්වර පවරනු ලබන විවිධ කාර්යයන්හි නිරතවීම.

## 12. ත්‍යාග ප්‍රදානයන්

| විෂය | තිළිණ ප්‍රමාණය | ප්‍රදානය |
|---|---|---|
| (අ) දේශීය තිළිණ ලාභීන් | 01 | ස්වර්ණ මුද්‍රිකාව - (බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාවේ වැඩිම ලකුණු ලාභියා) Ven. Julia Surya |
| | 01 | රජත මුද්‍රිකාව - (බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා) සෙව්වන්දි ලංකා විජේසූරිය මහත්මිය |
| එකතුව | 2 | |

## 13. පුනරාවර්තන වියදම් -

| විෂයය | 2013 රු.ශත | 2014 රු.ශත | වෙනස |
|---|---|---|---|
| (අ) වැටුප් හා වේතන | 23,051,791 | 27,351,260 | 4,299,469 |
| (ආ) ගමන් වියදම් | 90,469 | 162,293 | 71,824 |
| (ඇ) සැපයුම් | 1,986,845 | 2,466,255 | 479,410 |
| (ඈ) නඩත්තු | 789,693 | 1,052,452 | 262,759 |
| (ඉ) බැඳුම්ගත සේවා | 7,479,607 | 13,105,701 | 5,626,094 |
| (ඊ) වෙනත් | 7,960,793 | 10,903,488 | 2,942,695 |
| එකතුව | 41,359,198 | 55,041,449 | 13,682,251 |

## 14. ප්‍රාග්ධන වියදම් -

| විෂයය | 2013 (රු.ශත) | 2014 (රු.ශත) | වෙනස |
|---|---|---|---|
| (අ) ලී බඩු සහ කාර්යාලයීය උපකරණ මිළදී ගැනීම. | 853,185 | 3,140,306 | -2,287,121 |
| (ආ) යන්ත්‍ර උපකරණ මිළදී ගැනීම. | 0 | 0 | 0 |
| (ඉ) ගොඩනැගිලි | 0 | 0 | 0 |
| (ඊ) වෙනත් | 333,397 | 534,837 | -201,440 |
| එකතුව | 1,186,582 | 3,675,143 | -2,488,561 |

## 15. මුලාෘමය ප්‍රගතිය (වියදම්) -

| විෂයය | වෙන් කිරීම් | | වියදම | | අතිරික්ත/ඌනතාව (රු.ශත) | |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2013 | 2014 | 2013 | 2014 |
| (අ) පුනරාවර්තන (ව්‍යාපෘති හැර) | 40,790,000 | 50,886,000 | 39,206,998 | 51,113,361 | 1,583,002 | 227,361 |
| (ආ) ප්‍රාග්ධන (ව්‍යාපෘති හැර) | 2,550,000 | 2,500,000 | 1,186,582 | 3,675,143 | 1,363,418 | -1,175,143 |
| (ඇ) ව්‍යාපෘති - දේශීය ආයෝජන | 3,660,000 | 4,995,000 | 2,152,199 | 3,928,087 | 1,507,801 | 1,066,913 |
| (ඇ) ව්‍යාපෘති - විදේශීය ආයෝජන | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| එකතුව | 47,000,000 | 58,381,000 | 42,545,779 | 58,716,591 | 4,454,221 | 1,044,409 |

## 16. මූල්‍යමය ප්‍රගති විස්තරය (උපයන ලද ආදායම) -

| ආදායම් මාර්ග | වෙන් කිරීම් (රු. ශත) | | එකතුව (රු.ශත) ආදායම | | වෙන් කිරීම් (රු.ශත) | එකතුව (රු.ශත)ආදායම |
|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2013 | 2014 | 2013 | 2014 |
| (අ) උපාධි අපේක්ෂක | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| (ආ) පශ්චාත් උපාධි | 28,613,000 | 25,850,000 | 18,946,997 | 21,030,408 | 9,666,003 | 4,819,592 |
| (ඇ) උපදේශන සේවා | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| (ඇ) වෙනත් | 4,420,000 | 5,795,000 | 4,119,759 | 6,607,862 | 300,241 | (812,862) |
| එකතුව | 33,033,000 | 31,645,000 | 23,066,756 | 27,638,270 | 9,966,324 | 4,006,730 |

## 17. මූල්‍ය ප්‍රගති විශ්ලේෂණය - 2014

| විෂයය | ක්‍රමය | එක් සිසුවකු සඳහා වියදම | |
|---|---|---|---|
| | | 2013 | 2014 |
| (අ) එක් සිසුවකු සඳහා පුනරාවර්තන වියදම | පුනරාවර්තන වියදම ශිෂ්‍ය සංඛ්‍යාව | 65,976 | 64,247 |
| (ආ) එක් සිසුවකු සඳහා ප්‍රාග්ධන වියදම | ප්‍රාග්ධන වියදම ශිෂ්‍ය සංඛ්‍යාව | 5,493 | 5,350 |
| එකතුව | | 71,470 | 69,597 |

## 18. වාර්තාව සඳහා අදාළ වෙනත් තොරතුරු.

01. අවසාන ගිණුම් - 2014
02. 2010- 2014 දක්වා ආයතනයේ මූල්‍ය තත්වය.
03. කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(02) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු.

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
(කැලණිය විශ්ව විද්‍යාලය)

# අවසාන ගිණුම්
# 2014

අංක.113
දුටුගැමුණු වීදිය
කොහුවල

**2014 වර්ෂය සඳහා වන මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳව වන වාර්තාව**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයෙහි මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ 36 වන වාර්ෂික වාර්තාව.

2014 වර්ෂය සඳහා ලබාගත් වෙන්කිරීම් පහත දක්වා ඇත.

| | |
|---|---|
| පුනරාවර්තන වෙන්කිරීම | රු. 24,150,000.00 |
| 102 ප්‍රාග්ධන වෙන්කිරීම | රු. 2,000,000.00 |

රජයෙන් ලබාගත් වෙන්කිරීම් ඇතුළුව මෙම වසර සඳහා සමස්ථ පුනරාවර්ථන ආදායම රු.54,259,778 වන අතර පුනරාවර්ථන වියදම රු.55,041,448 වේ. ඒ අනුව පුනරාවර්ථන මූල්‍ය ක්‍රියාකාරකම්හි ප්‍රතිඵල වූයේ රු.781,671 ක හිඟ මුදලකි.

මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි
අධ්‍යක්ෂක

2014 වර්ෂය සඳහා වන වාර්ෂික ගිණුම් පිළිබඳව මූල්‍යාධිකාරීගේ වාර්තාව

ඉහත සඳහන් වර්ෂය සම්බන්ධයෙන් වන මෙම ආයතනයේ ගිණුම් වාර්තාව, කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන පොත් සහ ලේඛණ වලට අනුව සකස් කරනු ලැබ ඇති අතර මාගේ අවබෝධය හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි තොරතුරු වේ.

ඒ.පී.එස්.එම් දොලගේ මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

පාලි හා බෞද්ධ අධ්‍යයනය පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය
2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| වත්කම් | සටහන් | 2014 | | 2013 | |
|---|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම්(උපලේඛණය II) | | රු | රු | රු | රු |
| දේපල,යන්ත්‍ර සහ උපකරණ | 01 | 12,817,598 | | 9,542,898 | |
| ආයෝජන | 02 | 7,570,617 | | 7,043,706 | |
| වෙනත් මූල්‍ය වත්කම් | 03 | 902,382 | | 837,881 | |
| | | | 21,290,598 | | 17424485 |
| | | | | | |
| ජංගම වත්කම් | | | | | |
| ගබඩා අත්තිකාරම් ගිණුම් | 04 | 527,512 | | 456,629 | |
| තොග ගිණුම්(පොත් ප්‍රකාශන) | 05 | 1,069,653 | | 1,142,616 | |
| විවිධ ණයකරුවන් | 06 | 292,702 | | 188,688 | |
| කාර්ය මණ්ඩලයට ලබාදෙන ණය සහ අත්තිකාරම් | 07 | 4,023,664 | | 2,697,539 | |
| විවිධ අත්තිකාරම් | 08 | 46,885 | | 1,012 | |
| පූර්ව-ගෙවීම් | 09 | 805,410 | | 821,985 | |
| මුදල් හා මුදල් සම කොටස් | 10 | 12,832,901 | | 6,614,438 | |
| වෙනත් | 11 | 65,000 | 19,633,728 | 4,652,500 | 16,575,407 |
| මුළු වත්කම් | | | 40,954,325 | | 33,999,892 |
| | | | | | |
| වගකීම් | | | | | |
| ජංගම වගකීම් | | | | | |
| තැන්පතු | 12 | 49,144 | | 53,144 | |
| විවිධ ණය හිමියන් | 13 | 50 | | 50 | |
| උපචිත වියදම් | 14 | 1,928,943 | | 1,949,358 | |
| වෙනත් | 15 | 610,055 | | 509,408 | |
| ජංගම නොවන වගකීම් | | | 2,588,192 | | 2,511,960 |
| වියදම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන | 16 | 14,013,297 | | 11,745,940 | |
| වියදම් නොකරන ලද ප්‍රාග්ධන ප්‍රදාන | 17 | 465,537 | | 2,140,681 | |
| | | | 14,478,834 | | 13,886,621 |

| | | | | | |
|---|---|---|---|---|---|
| සීමිත අරමුදල් | | | | | |
| විශේෂ අරමුදල් | 18 | 6,491,812 | | 6,054,844 | |
| පර්යේෂණ ප්‍රදාන | 19 | 1,020,796 | | 961,310 | |
| ත්‍යාග සහ පරිත්‍යාග | 20 | 12,771,712 | | 10,549,982 | |
| වෙනත් | 21 | 3,231,891 | | 2,324,571 | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 22 | 6,984,073 | | 4,179,875 | |
| | | | 30,500,284 | | 24,070,583 |
| මුළු වගකීම් | | | 47,567,309 | | 40,469,163 |
| ශුද්ධ වත්කම් | | | (6,612,984) | | (6,469,270) |
| | | | | | |
| ශුද්ධ වත්කම්/ සම කොටස් | | | | | |
| ප්‍රාග්ධන අයවීම් | | | | | |
| ප්‍රතිතක්සේරු සංචිත ගිණුම් | | 798,276 | | 798.276 | |
| ආයතන වල පොදු සංචිත | 23 | (7,411,260) | (6,612,984) | (7,267,547) | (6,469,270) |
| | | | | | |
| මුළු ශුද්ධ වත්කම්/ සම කොටස් | | | (6,612,984) | | (6,469,270) |
| | | | | | |

ආයතනයේ කළමණාකරන මණ්ඩලය විසින්, එම මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් සකස් කරන ලද හා ඉදිරිපත් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම දරයි

මෙම මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවල අන්තර්ගත අවශ්‍යතා සමග අනුගත වේ.

මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි
අධ්‍යක්ෂක
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

වෛද්‍ය පී.ආර් වසන්ත ප්‍රියදර්ශන
කළමණාකරන මණ්ඩල සාමාජික පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

ඒ.පී.එස්.එම් දොලගේ මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

<u>පාලි හා බෞද්ධ අධ්‍යයනාය පශ්චාත් උපාධි ආයතනය,</u>
<u>කැලණිය විශ්ව විද්‍යාලය,</u>

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශනය.

| ආදායම | සටහන් | 2014 රු. | රු. | 2013 රු. | රු. |
|---|---|---|---|---|---|
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | | 24,150,000 | | 11,417,000 | |
| වෙනත් ආදායම් | | | | | |
| ණය පොලිය | | 136,078 | | 107,830 | |
| පැරණි තොග අලෙවිය | | - | | - | |
| විවිධ ලැබීම් | 24 | 804,449 | | 611,625 | |
| ලියාපදිංචි ගාස්තු | | 678,500 | | 575,000 | |
| පන්ති ගාස්තු | | 19,785,908 | | 17,368,279 | |
| විභාග ගාස්තු | | 125,000 | | 474,718 | |
| පුස්තකාල ගාස්තු | | 441,000 | | 529,000 | |
| ප්‍රකාශන අලෙවිය | | 7,670 | | 13,087 | |
| පුස්තකාල දඩ මුදල් | | 4,665 | | 6,714 | |
| ව්‍යාපෘති දීර්ඝ කිරීමෙන් ලැබෙන ආදායම | | 5,655,000 | | 4,119,759 | |
| ක්‍රමක්ෂය | 25 | 1,407,787 | | 1,191,704 | |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 25 | 1,063,721 | | 1,476,849 | |
| **මුළු ආදායම** | | | **54,259,778** | | **37,891,565** |
| | | | | | |
| **වියදම්** | | | | | |
| පුද්ගල වේතන - අධ්‍යයන | 25 | 11,751,294 | | 10,999,449 | |
| පුද්ගල වේතන - අනධ්‍යයන | 25 | 15,599,966 | | 12,052,342 | |
| ප්‍රවාහන | | 162,293 | | 90,469 | |
| සැපයුම් | | 2,466,255 | | 1,986,845 | |
| නඩත්තු | | 1,052,452 | | 789,693 | |
| කොන්ත්‍රාත් සේවා | | 13,105,701 | | 7,479,607 | |
| ක්ෂය වීම සහ වියදම් ක්‍රමක්ෂය | | 3,356,267 | | 3,047,842 | |
| වෙනත් වියදම් | | 7,547,221 | | 4,912,951 | |
| **මුළු වියදම්** | | | **55,041,448** | | **41,359,197** |
| | | | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන අතිරික්තය (හිඟ) | | | **(781,671)** | | **(3,467,632)** |
| <u>මූල්‍ය පිරිවැය</u> | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| දේපළ, යන්ත්‍ර සහ උපකරණ අලෙවියෙන් ලැබෙන ආදායම | | - | - | | |
| මෙහෙයුම් නොවන සමස්ත ආදායම (වියදම) | | | (781,671) | | (3,467,632 ) |
| අතිරික්ත/(හිඟ) - අතිවිශේෂ අයිතම | | | | | |
| අතිවිශේෂ අයිතම | | | - | | - |
| කාල සීමාව තුළ අතිරික්ත/( හිඟ) | | | (781,671) | | (3,467,632 ) |
| | | | | | |

ආයතනයේ කළමණාකරන මණ්ඩලය විසින්, එම මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් සකස් කරන ලද හා ඉදිරිපත් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබද වගකීම දරයි

මෙම මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවල අන්තර්ගත අවශ්‍යතා සමග අනුගත වේ.

මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි
අධ්‍යක්ෂක
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

වෛද්‍ය පී.ආර් වසන්ත ප්‍රියදර්ශන
කළමණාකරන මණ්ඩල සාමාජික පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

ඒ.පී.එස්.එම් දොලගේ මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය,
කැලණිය විශ්ව විද්‍යාලය,
**2014** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් සංචරණය පිළිබඳ ප්‍රකාශනය.

| | 2014 | | 2013 | |
|---|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම වලින් මුදල් සංචරණය වීම | රු. | රු. | රු. | රු. |
| වර්ෂය සඳහා අතිරික්ත/(හිඟ) | | (781,671) | | (3,467,632 ) |
| <u>මූල්‍යමය සම්බන්ධයක් නොවන අයිතම සඳහා ගැලපුම්</u> | | | | |
| පාරිතෝෂික | | 2,804,198 | | (324,508) |
| අවප්‍රමාණය වීම | | 3,260,130 | | 3,038,341 |
| ක්‍රමක්ෂය | | (1,407,787) | | (1,191,704) |
| | | 3,874,870 | | (1,945,502) |
| පූර්ව කාලීන අයිතම | | - | | - |
| කාරක ප්‍රාග්ධන වල අයිතම වෙනස්වීමට පෙර මෙහෙයුම් අතිරික්තය | | **3,874,870** | | **(1,945,502)** |
| <u>කාරක ප්‍රාග්ධන වල අයිතම වෙනස්වීම</u> | | | | |
| ගබඩා අත්තිකාරම් සහ පර්යේෂණ සහ ප්‍රකාශන තොගවල අඩුවීම අඩුවීම/(වැඩිවීම) | 2,080 | | (76,206) | |
| විවිධ ණයකරුවන් අඩුවීම/(වැඩිවීම) | (104,014) | | 103,333 | |
| කාර්ය මණ්ඩල අත්තිකාරම් අඩුවීම/(වැඩිවීම) | (1,326,125) | | 386,165 | |
| සේවා සහ සැපයුම් අත්තිකාරම් අඩුවීම/(වැඩිවීම) | (45,873) | | 46,950 | |
| අත්තිකාරම් ගෙවීම් අඩුවීම් අඩුවීම/(වැඩිවීම) | 16,575 | | (788,229) | |
| වෙනත් තැන්පතු අඩුවීම/(වැඩිවීම) | 4,587,500 | | 107,500 | |
| ආයෝජන ලැබීම් මත පොලිය අඩුවීම/(වැඩිවීම) | - | | - | |
| තැන්පතු සහ විවිධ ණය හිමියන් වැඩිවීම/(අඩුවීම) | (4,000) | | 17,940 | |
| උපචිත වියදම් සහ වෙනත් වගකීම් වැඩිවීම/(අඩුවීම) | 80,232 | 3,206,374 | 510,851 | 308,304 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ දළ ආදායම්** | | **7,081,244** | | **(1,637,198)** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් සංචරණය වීම</u> | | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (3,675,143) | | (1,186,582) | |
| වෙනත් ආයෝජන | (591,412) | | (842,832) | |
| අයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදාගනු ලැබූ ශුද්ධ මුදල් | | **(4,266,555)** | | **(2,029,413)** |

| | | | | |
|---|---|---|---|---|
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් සංචරණය | | | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදාන | 2,000,000 | | 2,550,000 | |
| ත්‍යාග සහ පරිත්‍යාග | - | | - | |
| වෙනත් අරමුදල් | 1,403,774 | | 1,253,596 | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උපයා ගන්නා මුදල් | | 3,403,774 | | 3,803,596 |
| **මුදල් සහ මුදල් සම කොටස් වල ශුද්ධ වැඩිවීම** | | **6,218,463** | | **136,984** |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සම කොටස් වල පැවති ශේෂය | | 6,614,438 | | 6,477,454 |
| **වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් සම කොටස් වල පැවති ශේෂය (සටහන 1)** | | **12,832,901** | | **6,614,438** |
| | | | | |
| **සටහන 1** | | **2014** | | **2013** |
| | | (රු.) | | (රු.) |
| බැංකු ශේෂය | | 12,832,901 | | 6,614,438 |
| වෙනත් බැංකු ශේෂය | | - | | - |
| | | **12,832,901** | | **6,614,438** |

පාලි හා බෞද්ධ අධ්‍යයනය පශ්චාත් උපාධි ආයතනය,
කැලණිය විශ්ව විද්‍යාලය,

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා දළ වත්කම්/සම කොටස් හි වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය.

| | ආයතනවල පොදු සංචිත<br>රු. | සංචිත ගිණුම් ප්‍රති-තක්සේරුකරණය<br>රු. | මුළු<br>රු. |
|---|---|---|---|
| **2012-01-01 දිනට ශේෂය** | **(1,089,945)** | **798,276** | **(291,669)** |
| 2012 වර්ෂය සඳහා අතිරික්ත/( හිඟ) | (2,709,969) | - | (2,709,969) |
| **2013-01-01 දිනට ශේෂය** | **(3,799,915)** | **798,276** | **(3,001,638)** |
| 2013 වර්ෂය සඳහා අතිරික්ත/(හිඟ) | (3,467,632) | - | (3,467,632) |
| **2014-01-01 දිනට ශේෂය** | **(7,267,547)** | **798,276** | **(6,469,270)** |
| පරිත්‍යාග කරන ලද අයිතම වල අගය මාරු කිරීම | 637,957 | | 637,957 |
| 2014 වර්ෂය සඳහා අතිරික්ත/හිඟ | (781,671) | | (781,671) |
| **2014-12-31 දිනට ශේෂය** | **(7,411,260)** | **798,276** | **(6,612,984)** |

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

1. සුවිශේෂ ගිණුම්කරන ප්‍රතිපත්ති

1.1.පොදු ප්‍රතිපත්ති

1.1.1 කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය , 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ සහ 1979 අංක 08 දරණ පාලි හා බෞද්ධ අධ්‍යය පශ්චාත් උපාධි ආයතන ආඥා පනත මගින් සංස්ථාපිත කරන ලදී.

1.1.2 ප්‍රධාන කාර්යයන් සහ ක්‍රියාකාරිත්වයේ ස්වභාවය

මෙම ආයතනය මගින් පාලි හා බෞද්ධ අධ්‍යයනය විශේෂයෙන් හදාරන පශ්චාත් උපාධි සිසුන් සඳහා උපදෙස්, පුහුණුව සහ පර්යේෂණ සපයනු ලබන අතර පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා ද පිරිනමනු ලබයි.

2 අනුකූලතා ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශනය,මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශනය,ශුද්ධ වත්කම්/සම කොටස් මගින් අයකිරීම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ගැලීම් ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් වලින් සමන්විත වේ.

මෙම ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුව සකස් කරනු ලැබ ඇති අතර , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මූල්‍ය චක්‍රාලේඛන ලිපි අංක 03/2011 අදාල කරගනු ලැබ ඇත.

3 වත්කම් සහ ඒවා තක්සේරුකරනයේ පදනම

3.1 දේපල, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ

3.1.1 හඳුනාගැනීම සහ මැනුම්කරණය

දේපල, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ අඩු පිරිවැය සමුච්චිත අවප්‍රමාණය මත වාර්තාකරනු ලබයි.දේපල,යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා වන පිරිවැය යනු අපේක්ෂිත භාවිතය සඳහා අවශ්‍ය වන ආකාරයට සකස් කර ගැනීමට සෘජුවම දැරීමට සිදුවන ආනුෂංගික වියදම් ඇතුළු මිලදී ගැනීමේ පිරිවැයයි.

3.1.2 ක්ෂය වීම

මෙම වත්කම්වල පිරිවැය, එම වත්කම්වල ඇස්තමේන්තු කළ උපයෝගී ආයු කාලය මත කපාහැරීම පිණිස පහත සඳහන් වාර්ෂික මිල ගණන් වල සෘජු රේඛීය පදනමක් මත ක්ෂය වීම මෙම ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කර ඇත.

| | |
|---|---|
| 102-ගෘහභාණ්ඩ සහ උපකරණ | 10% |
| 102-කාර්යාලීය ගෘහභාණ්ඩ සහ උපකරණ | 20% |
| 102-විද්‍යාගාර සහ ඉගැන්නුම් උපකරණ | 20% |
| 102- පුස්තකාල පොත් සහ වාරප්‍රකාශන | 20% |

102-මෝටර් රථ 20%

3.2 තොග ලේඛණ

FIFO පදනම මත පදනම්වූ පිරිවැය මත තොග ලේඛණ ගණනය කරනු ලබයි.

3.3 ණයකරුවන්/අය විය යුතු

ණය සහ අත්තිකාරම් ලබාගත් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් ණයකරුවන් ලෙස හැඳින්වේ. අයහපත් ණයකරුවන් සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබ නැත. ණය සහ අත්තිකාරම් ලබාදෙනුයේ ඔවුන්ගේ අර්ථසාධක ඇප ලෙස තබාගනිමිනි.

4 වගකීම්

4.1 විශ්‍රාම පාරිතෝෂික

**1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම යටතේ සුදුසු සේවකයින් සඳහා ප්‍රතිලාභ සැලසුම් ලබාදීමට මෙම ආයතනය කටයුතු කර ඇත.**

2010 – 2014 දක්වා ආයතනයේ මූල්‍ය තත්වය.

| වර්ෂය | පුනරාවර්තන සඳහා රජයේ ආධාර | 102 - මූලධන සඳහා රජයේ ආධාර | තොරතුරු තාක්ෂණ සඳහා රජයේ ආධාර | ආයතනික ඉපයීම් | මුළු පුනරාවර්තන ආදායම | මුළු පුනරාවර්තන වියදම | පුනරාවර්තන මූල්‍යකටයුතු වල ප්‍රතිඵලය |
|---|---|---|---|---|---|---|---|
| 2010 | 7,900,000 | 400,000 | -- | 28,878,711 | 28,878,711 | 25,070,959 | 3,807,753 |
| 2011 | 7,314,146 | 750,000 | -- | 29,121,279 | 29,121,279 | 28,440,621 | 680,658 |
| 2012 | 6,500,000 | 1,600,000 | -- | 25,864,163 | 32,364,163 | 35,074,132 | -2,709,969 |
| 2013 | 11,417,000 | 2,550,000 | -- | 26,474,565 | 37,891,565 | 41,359,197 | -3,467,632 |
| 2014 | 24,150,000 | 2,000,000 | -- | 27,638,270 | 54,259,778 | 55,041,448 | (781,671) |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல / My No. } පීඑස්/එල්/ පීඅයිපීබීඑස් /1/14/70 ඔබේ අංකය / உமது இல / Your No } දිනය / திகதி / Date } 2015 ඔක්තෝබර් ... දින

අධ්‍යක්ෂ,

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව මෙ සමඟ එවා ඇත.

SAR / Bursar

2015.10.19.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

පිටපත් :-

1. ලේකම් - විශ්වවිද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊසී/එච්/ පීඅයිපීබීඑස් /1/14/70

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 ඔක්තෝබර් 09 දින

අධ්‍යක්ෂ,

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

අධ්‍යක්ෂ කාර්යාලය DIRECTOR'S OFFICE 12 OCT 2015 කැලණිය විශ්වවිද්‍යාලය University of Kelaniya P.G.I.P.B.S

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

SAR / Bursar

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

2015.10.19

පිටපත් :-

1. ලේකම් - විශ්වවිද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති - කැළණිය විශ්වවිද්‍යාලය

11/12

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව

AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / My No. } ඊසී/එෆ්/ පීඅයිපීබීඑස් /1/14/70    ඔබේ අංකය / Your No. }    දිනය / Date } 2015 ඔක්තෝබර් 02 දින

අධ්‍යක්ෂ,

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2015 අගෝස්තු 11 දින නිකුත් කරන ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

Auditor General's Department

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය සළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව ත්‍යාග හා ආධාර යටතේ ලද පිරිවැය රු.12,771,712 ක් වූ වත්කම් සමාලෝචිත වර්ෂයේදී ක්‍රමක්ෂය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල ලැබූ රු.591,412 ක ආයෝජන පොලිය වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කිරීම වෙනුවට අරමුදල් ගිණුම් වලට බැර කර තිබුණි.

(ආ) 2013 වර්ෂයට අදාළ වත්කම් සඳහා වූ ක්ෂය අධි වෙන්කිරීම රු.53,906 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේදී අනුචිත පරිදි සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණයෙන් අඩුකර දක්වා තිබුණි.

2.2.3 නොසැසඳු පාලන ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූලා ප්‍රකාශනවල දක්වා තිබූ ප්‍රකාශන තොගයේ වටිනාකම රු.1,069,652 ක් වූ අතර ගබඩා තොග ලේඛණය අනුව එහි වටිනාකම රු.951,405 ක් වූයෙන් රු.118,247 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූලා ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව පුස්තකාල පොත් පරිත්‍යාග හා මිලට ගැනුම් ප්‍රමාණයන් රු.641,724 ක් වූ අතර පුස්තකාලය විසින් ඉදිරිපත් කරන ලද උපලේඛනය සමඟ සැසඳීමේදී රු.19,853 වෙනසක් නිරීක්ෂණය විය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ සිට තැන්පතු යටතේ දක්වා තිබූ රු.11,075 ක අවිනිශ්චිත ගිණුම් ශේෂය හඳුනාගෙන මූලා ප්‍රකාශන වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට මූලා ප්‍රකාශන වල දක්වා තිබූ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි පාඨමාලාවේ උපදේශක සේවා වෙනුවෙන් නිරවුල් කළ යුතු රු.50,000 ක මුදලක් 2015 අගෝස්තු මාසය වන විට ද නිරවුල් කර නොතිබුණි.

(ඇ) 1994 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා විවිධ පාර්ශවයන්ට ලබා දී තිබූ පුස්තකාල පොත් වෙනුවෙන් අයවිය යුතු රු.30,068 ක් 2015 ජුලි 30 දක්වා අයකරගෙන නොතිබුණි.

AGDSL

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

---

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1) වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා අදාල පොත්පත් ලේඛන පවත්වා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.14,738,127 ක් ගෙවා තිබුණි. |
| (ආ) 2000 ජූනි 14 දිනැති අංක 87 (i) දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3 ඡේදය | අතිකාල දීමනා ගෙවීම පැය 20 ට සීමා කළ යුතු බවත් එම සීමාව ඉක්මවීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිශ්චිත අධිකාර බලය ලබාගත යුතු වුවත් ආයතනය විසින් එයින් බැහැරව සෑම මාසයකම පැය 20 ට වැඩියෙන් අතිකාල සේවයේ යොදවා ගෙන අතිකාල දීමනා ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. |
| (ඇ) 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ගබඩා පරිශ්‍රය භෞතිකව පරීක්ෂා කිරීමේදී භාවිතයට නොගන්නා අපහරණය කළ යුතු භාණ්ඩ විශාල ප්‍රමාණයක් ගබඩාවේ පැවතීම හේතුවෙන් ගබඩාවේ ඉඩකඩ ඇහිරී තිබුණි. පසුගිය විගණන වාර්තා මගින් ද මේ පිළිබඳ අනාවරණය කළ නමුත් 2015 ජූලි 30 දින දක්වාම එම භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය වියිමත්ව පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2011 සැප්තැම්බර් 15 දිනැති අංක PED 58(2 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 2.4 ඡේද | කළමනාකරණ මණ්ඩල/ විගණන හා කළමනාකරණ රැස්වීම සඳහා සහභාගී වන නිළධාරීන්ට ප්‍රවාහන පහසුකම් නොසපයන විටක ඒ සඳහා සාධාරණ පදනමක් මත ප්‍රවාහන දීමනා ගෙවිය හැකි වුවත් මෙම ආයතනය විසින් කිසිදු චක්‍රලේඛයක සඳහන් නොවන සූත්‍රයක් භාවිතා කරමින් කුලී රථ ගාස්තු වලට වඩා ඉහළ ප්‍රවාහන ගාස්තු ගෙවා තිබුණ බව නිරීක්ෂණය විය. |
| (ඊ) | 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සති අන්තයේ හා රජයේ නිවාඩු දිනවල වැඩ කිරීම වෙනුවෙන් ලිත් මාසයකට, දින 02 කට වැඩි දින ගණනක් සේවයේ යෙදවීම අවශ්‍ය වන්නේ නම් අදාල අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් එයින් බැහැරව නිවාඩු දින රාජකාරි සඳහා දීමනා ගෙවා තිබුණි. |
| (උ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අමාත්‍ය මණ්ඩලය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ භාණ්ඩාගාරය නිශ්චිතවම අනුමත කළ දීමනා පමණක් කළමනාකරණ මණ්ඩල අනුමැතිය ඇතිව ගෙවීම් කළ හැකි වුවත් එයට පටහැනිව ආයතනය පවත්වා ගෙන යනු ලබන අමතර ව්‍යාපෘති පාඨමාලා 3 ක් වෙනුවෙන් අදාළ නිළධාරීන් වෙත කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත පමණක් විවිධ දීමනා ලෙස රු.271,948 ක් ගෙවා තිබුණි. |
| (ඌ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 7.4.5 වගන්ති | වාර්ෂිකව සිදුකළ යුතු පොත් සමීක්ෂණය 2015 ජුලි 30 වන විටත් සිදුකර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.781,671 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.3,467,632 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.2,685,961 කින් අඩුවී තිබුණි. පාඨමාලා ආදායම රු.2,417,629 කින් සහ රජයේ ප්‍රදාන රු.12,733,000 කින් වැඩිවීම ඌනතාවය අඩුවීම සඳහා විශේෂයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අධ්‍යයන කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් පවත්වා තිබූ එක් අවුරුදු පාඨමාලා 07 න් බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව, පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව හා බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා වූ ශිෂ්‍ය ලියාපදිංචිය සමස්ථ ශිෂ්‍ය ලියාපදිංචියෙන් සියයට 17.11 ක් පමණක් විය.

(ආ) සමස්ථ ශිෂ්‍ය ලියාපදිංචිය හා සසඳන විට ශිෂ්‍යයින්ගේ වැඩි ආයකත්වයක් බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා යොමු වී තිබුණි. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (සිංගප්පූරුව) සඳහා ශිෂ්‍යයන් 08 ක් පමණක් ලියාපදිංචි වී සිටි අතර ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සිංගප්පූරුව) සඳහා එකදු ශිෂ්‍යයකු හෝ ලියාපදිංචි වී නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ සමස්ථ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 450 ක් වුවද, එයින් විභාග වලට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 371 ක් පමණක් වූ අතර ඉන් ශිෂ්‍යයන් 307 ක් පමණක් විභාගය සමත් වී තිබුණි.

(ඈ) ආයතනය විසින් පවත්වනු ලැබූ එක් අවුරුදු පාඨමාලාවලට අමතරව බෞද්ධ අධ්‍යයන දර්ශනපති උපාධිය (M. Phill) හා බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද (Ph.D) උපාධිය හදාරන ලද 237 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සමාලෝචිත වර්ෂයේදී උපාධිය සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව 08 ක් පමණක් විය.

(ඉ) English Through Buddhism පාඨමාලාව සඳහා ලියාපදිංචි 104 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 71 ක් විභාගයට පෙනී සිටි අතර එයින් 32 ක් පමණක් සමත් වී තිබූ අතර විභාගයට ඉදිරිපත් නොවූ ශිෂ්‍ය සංඛ්‍යාව 33 ක් විය.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය වසර 36 ක කාලයක් තුළදීම කුලී ගොඩනැගිලි තුළ පවත්වාගෙන ගොස් තිබූ අතර 2014 පෙබරවාරි සිට වාර්ෂිකව රු.9,174,999 කට නව ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණි. ඉඩමක් අත්පත් කර ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීම සඳහා 2014 ජූනි මාසයේදී ආයතනය විසින් ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාවක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් සංශෝධන සහිතව අනුමත කර තිබුණද ඉඩමක් අත්පත් කර ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීම සම්බන්ධ කටයුතු 2015 ජූලි වන තෙක් සාර්ථක වී නොතිබුණි.

(ආ) ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා ලැබී තිබූ රු.760,488 ක විදේශ අරමුදල් ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර ගණනාවකින් අදාල කාර්යය ඉටු කිරීම සඳහා උපයෝජනය කර ගෙන නොතිබුණි.

4.3 කාර්යය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් මාසයේ සිට වර්ෂ 02 කට අධික කාලයක් තුල පුරප්පාඩුව පවතින ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි තනතුර වැඩ බැලීමේ පදනමට ක්‍රියාත්මක වන අතර අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලයේ පවතින පුරප්පාඩු 09 ක් පිරවීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

5. ගිණුම්කටයුතුභාවය හා යහ පාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

ආයතනය විසින් 2014 වර්ෂය සඳහා ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු 10ක් සහිතව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු අතර එම අරමුණුවලින් 04 ක් පමණක් වර්ෂය තුල සම්පූර්ණයෙන් නිම කර ගැනීමට හැකිව තිබුණි. ක්‍රියාකාරකම් 05 ක් නිම වෙමින් පැවති අතර එක් ක්‍රියාකාරකමක් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම්, සත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී පිළිවලින් සියයට 51 සිට සියයට 72 දක්වාද සියයට 51 සිට සියයට 1718 දක්වා ද පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් පැවති අතර මේ අනුව අයවැය ලේඛනය ඵලදායි කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගබඩා පාලනය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) මුදල් පාලනය

(ඈ) වාහන පාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැළණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
POSTGRADUATE INSTITUTE OF PALI AND BUDDHIST STUDIES
UNIVERSITY OF KELANIYA - SRI LANKA

No. 113, Dutugemunu Street, Kohuwala. නො. 113, දුටුගැමුණු වීදිය, කොහුවල.

මගේ අංකය :
My No : PIPBS/ST/03/2015-02

ඔබේ අංකය :
Your No :

2015.12.10

<u>ලියාපදිංචි තැපෑල</u>

විගණකාධිපති (වැඩ බලන),
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

ප්‍රිය මහත්මයාණෙනි,

**<u>කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් අංක ඊසී/එෆ්/පීඅයිපීබීඑස්/1/14/70 හා 2015.10.07 වැනි දිනැතිව එවා ඇති ලිපියට අනුව අදාළ පිළිතුරු කෙටුම්පත 2015.12.09 දින පැවැති 42 වැනි විගණන කමිටුවට ඉදිරිපත් කරන ලදුව, කළමනාකාර මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව විගණකාධිපතිතුමා වෙත යැවීමට අනුමත කරන ලදී.

**2.2** <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

**2.2.1** <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති</u>

මූල්‍ය ප්‍රකාශන අනුව 2014.12.31 වැනි දින වන විට ත්‍යාග සහ ආධාර ගිණුමේ ශේෂය රු. 12,771,712/-කි. මින් 2014 වර්ෂයට අදාළ වනුයේ රු.2,859,687/-ක් පමණි. කෙසේ වෙතත් 2015 අවසන් ගිණුම් සකස් කිරීමේදී රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට සටහන් කර ගතිමි.

**2.2.2** <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) ගොඩනැගිලි වාහන අරමුදලේ සහ ගිවිසුම් කඩකිරීමේ අරමුදල් නිශ්චිත අරමුණක් වෙනුවෙන් පිහිටුවා ඇති නිසා එම ආයෝජනවලින් ලද පොළී ආදායම ද වෙනම ම අදාළ නිශ්චිත අරමුණ උදෙසා භාවිතා කිරීමේ අරමුණින් පවත්වා ගෙන ගොස් ඇත.

මේ පිළිබඳව අවධානය යොමු කළ 41 වන විගණන කමිටුව අයෝජන පොලිය වර්ෂයේ ආදායමට නොගෙන අදාළ අරමුදල් ගිණුමට බැර කිරීම නිවැරදි බවට නිර්දේශ කර ඇත.

අධ්‍යක්ෂ
Director
011 3132323
E-mail : pgipbs@sltnet.lk

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
Senior Assistant Registar
011 2809322
සාමාන්‍ය/General 011 2809321

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි
Senior Assistant Bursar
011 5839851
ෆැක්ස්/Fax 011 2809322

(ආ) 2013 වර්ෂයට අදාළ ක්ෂය අය වෙන් කිරීම රු.53,906/-ක මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී මෙහෙයුම් ආදායම කාරක ප්‍රාග්ධන විචලනයන්ට පෙර (operating surplus before working capital changes) අඩු කළ යුතු වුවත්, එම මුදල වර්ෂයේ ක්ෂය වියදමෙන් අඩුකර දක්වා ඇත. මෙමඟින් මුදල් ප්‍රවාහයේ අගයන්ට හෝ මෙහෙයුම් ප්‍රකාශයට කිසිදු බලපෑමක් සිදු වී නොමැති අතර එය ඉදිරිපත් කිරීමේ වෙනසක් පමණක් වේ.

2.2.3 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

(අ) මෙම අගයට 2014 වර්ෂයේ ගනුදෙනු මත කිසිදු බලපෑමක් සිදු වී නොමැති අතර 2014 වර්ෂයේ ප්‍රකාශන නිකුත් කිරීම නිසි පරිදි සිදු වී ඇත.

කෙසේ වෙතත් තොගයේ වෙනසට පහත කරුණු හේතු වී ඇත.

මෙම ආයතනය මගින් ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීමට ආරම්භ කර ඇත්තේ 1996 වර්ෂයේ සිට වන අතර එදා සිට මේ දක්වා ආයතනයට ස්ථිර ගොඩනැගිල්ලක් නොමැති කමින් ආයතනය විවිධ ස්ථාන වෙත මාරු කිරීමේදී පොත්වලට හානි සිදුවීම, අලෙවිය සඳහා විවිධ පුද්ගලයන්ට/ආයතනවලට ලබාදුන් පොත් නැවත නොලැබීම ආදිය.

ප්‍රකාශන තොගයේ වෙනස හා ඊට බලපෑ හේතු පිළිබඳව අධ්‍යයනය කොට අදාළ අධිකාරී වෙත ඉදිරිපත් කොට ඉදිරියේදී තීරණයක් ගැනීමට නියමිතය.

(ආ) අදාළ වටිනාකම් ගණනය කිරීමේදී සිදු වූ අඩුපාඩුවකින් එකී වෙනස ඇති වී ඇති බව හඳුනා ගන්නා ලදී.

2.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) 2011 වර්ෂයේදී අබලි භාණ්ඩ වෙන්දේසි කොට ලද මුදලින් මෙම රු.11,075/-ක අවිනිශ්චිත ගිණුම් සකස් වී ඇත. මෙසේ වෙන්දේසි කරන ලද භාණ්ඩවලට අදාළ තොරතුරු නොමැති වීම හේතුවෙන් අදාළ වත්කම් ගිණුම්වලින් මෙම වත්කම් ඉවත් කර නිසි පරිදි ලාභ/අලාභ ගැලපීමට නොහැකි වී ඇත.

(ආ) මෙම රු.50,000/-ක මුදල 2010 වර්ෂයේ සිට විවිධ අවස්ථාවල බෞද්ධායුර්වේද උපදේශන පාඨමාලාව වෙනුවෙන් ශිෂ්‍යයන් ගෙවූ මුදල් වන අතර එම මුදල් නැවත ඔවුන් වෙත ගෙවිය යුතු නිසා මෙම මුදල් උපචිත ලෙස ගිණුම්වල දක්වා ඇත.

මෙම මුදල් නැවත ඔවුන් වෙත ගෙවන්නේ ද නැද්ද යන්න පිළිබඳ අදාළ අංශවලින් විමසීම් කිරීමෙන් අනතුරුව 2015 වර්ෂයේ ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කිරීමට සටහන් කර ගතිමි.

(ඇ) ඉදිරිපත් කොට ඇති තොරතුරු නිවැරදියි.

2.4 <u>නීති, රීති,රෙගුලාසි හා කළමනාකරන තීරණවලට අනුකූල නොවීම.</u>

(අ) 2013 වර්ෂයේ පැවැති ව්‍යාපාර පොදු කාරක සභා (COPE) පාර්ලිමේන්තු රැස්වීමේදී ලබා දුන් උපදෙස් පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන්ගේ පැමිණීම හා දේශන පැවැත්වීම පිළිබඳ සියලු වාර්තා පෞද්ගලිකව දින පොත්වල සටහන් තබා ගන්නා බව දැනුම් දී ඇත. එසේම පර්යේෂණ ශිෂ්‍යයන් සඳහා ආචාර්යවරුන් වෙන් කොට ඇති දින සහ වේලාවන් මෙන් ම ලබාගත් නිවාඩු සඳහා අවශ්‍ය තොරතුරු ආයතනය වෙත ලබා දී ඇත. එබැවින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවය ගණනය කරන්නේ වෙනත් ක්‍රමවේදයන් අනුව බව දන්වා සිටිමි.

(ආ) පශ්චාත් උපාධි හදාරන බොහොමයක් සිසුන් රැකියාවල හා විවිධ සේවාවන්වල නියුතු අය බැවින් මෙම ආයතනයේ සියලුම පාඨමාලාවන් සාමාන්‍ය සේවා කාල වේලාවෙන් බැහැර වන පරිදි පැවැත්වීමට සිදුවේ.

මෙම කරුණ හේතුවෙන් සේවකයන් අතිකාල සේවයේ යොදවා කාර්යයන් ඉටු කරවා ගැනීම අනිවාර්යය කරුණක් වන අතර මෙම කරුණු සම්බන්ධව ආයතනයේ කළමනාකාර මණ්ඩලයේ උපදෙස් පරිදි අතිකාල සීමා අනුමැතිය වැඩිකර ලබා ගැනීම පිළිබඳව උසස් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගෙන් අවසර ඉල්ලන ලදී. ඒ අනුව එම අමාත්‍යාංශය මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ **'Improving Governance'** අත්පොතෙහි දක්වා ඇති පරිදි අතිකාල සම්බන්ධයෙන් වූ විධිවිධාන අනුව කටයුතු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව එහි සඳහන් පරිදි ආයතන ප්‍රධානයාගේ අනුමැතිය මත අත්‍යවශ්‍ය වන සේවකයින් හට පමණක් අතිකාල අනුමත කර අදාළ සේවාවන්හි යොදවා ඇත.

(ඇ) මෙම භාණ්ඩ අපහරණය පිළිබඳ කටයුතු ඉතා ඉක්මනින් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

(ඈ) 2014.12.31 වැනි දිනට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර ඇත.

ඒ අනුව වත්කම් වර්ග කිරීම, හඳුනා ගැනීම ගිණුම්ගත කිරීම, ඒවායෙහි පාලනය පහසු කරවීම් වස් එක් එක් ස්ථාවර වත්කම් වෙනුවෙන් දෙපාර්තමේන්තුමය අංක නිකුත් කර ඒවා වත්කම් මත ඇලවීම සිදුකර අවසන් කර ඇත.

තවදුරටත් අගයන් හඳුනා ගත නොහැකි වත්කම් වෙනුවෙන් අගයන් ආදේශ කිරීම සඳහා අවශ්‍ය සේවය ලබා ගැනීමට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දන්වා යවා ඇති අතර එම කටයුතු නිමවූ පසු ගිණුම් පොත් සමඟ සංසන්දනය කිරීමට නියමිතය. එහෙත් 2014 වර්ෂයේ ලේඛනය සිට ස්ථාවර වත්කම් ලේඛනය ගිණුම් පොත් සමඟ සමගාමීව ඉදිරියට කර ගෙන යනු ලැබේ.

(ඉ) කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභා හා පීඨසභා බාහිර නියෝජිතයන් හට ගෙවීම් කරන පදනම මත අදාළ නිලධාරීන් රැස්වීම් සඳහා සහභාගි කරවා ගැනීමේ අත්‍යවශ්‍ය කාරණය යන පදනම මත මෙම ගෙවීම් සිදුකර ඇත.

(ඊ) සති අන්තවල පමණක් පැවැත්වෙන ස්වයං මූල්‍ය පාඨමාලාවල සේවා අධීක්ෂණය පිණිස වන පැමිණීමේ දීමනාවන් අදාළ සේවාවන් අත්‍යවශ්‍යයෙන්ම ඉටු කරවා ගත යුතු පදනම මත විශ්වවිද්‍යාලයීය නිර්ණායක අනුගමනය කර සකසා කළමනාකාර මණ්ඩලය අනුමත අයවැය ලේඛනයක ප්‍රතිපාදන මත මෙලෙස ගෙවා ඇත.

(උ) පශ්චාත් උපාධි ආයතනවල ස්වයං මූල්‍ය පාඨමාලා ප්‍රවර්ධනය කිරීම පිණිස වන විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිය මත එම පාඨමාලාවලට අදාළ සේවාවන් ලබා ගැනීම දිරිගැන්වීම පිණිස වන දීමනා අදාළ නිර්ණායක මත පදනම්ව මෙම ගෙවීම් කර ඇත.

(ඌ) පොත් සමීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අධ්‍යයන කාර්ය සාධනය

(අ) මෙය සාමාන්‍ය තත්වයකි.
(ආ) ඉහත නිරීක්ෂණය සත්‍ය වේ. අදාළ පාඨමාලා සඳහා වන ඉල්ලුම පරිදි අදාළ ශිෂ්‍ය සංඛ්‍යාව තීරණය වේ.
(ඇ) අදාළ ශිෂ්‍යයන් හට පෞද්ගලික වූ විවිධ හේතූන් මත විභාගයට පෙනී සිටීම තීරණය විය හැකි අතර එම සිසුන්ගේ පෞද්ගලික කුසලතා මත විභාග සමත්වීම තීරණය වේ.

(ඈ) අර්ධකාලීනව පාඨමාලා හදාරන වැඩිහිටි සිසුන් බොහෝ සංඛ්‍යාවක් ද විදේශ සිසුන් ද සිටින බැවින් ඔවුන්ගේ වෘත්තීය, පෞද්ගලික හා සෞඛ්‍යමය හේතූන් මත මෙම පර්යේෂණ උපාධි කාලසීමාව පීඨසභාවේ අනුමැතිය සහිතව අදාළ ශිෂ්‍යයන්ගේ අවශ්‍යතාවන් හා උපදේශකවරුන්ගේ නිර්දේශයන් ද අනුව වෙනස් විය හැක. අදාළ වර්ෂය සඳහා දක්වා ඇති සාමාර්ථ ප්‍රමාණය උසස් ප්‍රවණතාවක් බව කිව හැක.

(ඉ) සත්‍ය වේ.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) මේ කාරණය සම්බන්ධයෙන් 2015 අයවැය මගින් වෙන් කර දී තිබූ 2015 වර්ෂයට අදාළ රු.මිලියන 500 මගින් ආයතනය හඳුනාගත් ඉඩමක් අත්පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය හා ඉඩම් අමාත්‍යාංශය මගින් ඉටු කරවා ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් අතර එම කාර්යයට අදාළ ප්‍රතිපාදන 2016 අයවැය මගින් ලබා ගැනීම සඳහා අදාළ අංශ වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.

(ආ) මේ සම්බන්ධයෙන් ආයතන පීඨසභාව විසින් නිර්දේශිත ක්‍රමවේදයකට මෙම ශිෂ්‍යත්ව 2014 වර්ෂයේ සිට උපාධි සමත් වූ ශිෂ්‍යයන්ට ප්‍රදානය කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කෙරෙමින් පවතී.

4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

සත්‍ය වේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි තනතුරෙහි රාජකාරි කළ නිලධාරියා තමාට හිමි අධ්‍යයන හා සප්තවාර්ෂික නිවාඩු ලබාගත් බැවින් ඇය නැවත සේවයට වාර්තා කරන තෙක් මෙ සඳහා පත් කළ හැකිව තිබුනේ වැඩ බැලීමේ නිලධාරියකු පමණක් වේ. ඒ අනුව විගණන දිනය වන විට අදාළ තනතුර පුරප්පාඩුව තිබුනේ මාස 07ක් පමණි.

මෙහි නියමිත පුරප්පාඩුව ඇතිවූ 2014 දෙසැම්බර් 09 වන දිනෙන් පසු අදාළ පත් කිරීම් බලධාරීයා වන විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත පුරප්පාඩුව පිරවීම සඳහා දැනුම් දී ඇත.

5. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

ඉටු කරවා ගත නොහැකිවූ ක්‍රියාකාරකම් සම්බන්ධව කටයුතු කර ගෙන යනු ලැබේ.

5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැය ලේඛනය ආයතනයේ වියදම් පාලනය සම්බන්ධයෙන් පාලන කාරකයන් ලෙස භාවිතා කරන නමුත් යම් යම් නොවැලැක්විය හැකි හේතු මත විචලතාවයන් සිදුවේ.

උදා: අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පර්යේෂණ දීමනා ගෙවීමට උපදෙස් සහිත චක්‍රලේඛය නිකුත් වූයේ 2014 වර්ෂයේ මැද භාගයේදීය.

කෙසේ වෙතත් මේ පිළිබඳ පූර්ව නිරීක්ෂණයට භාජනය කොට 2015 වසරේදී උපරිම වශයෙන් මූල්‍ය පාලන කාරකයන් ලෙස අයවැය භාවිතා කිරීමට සටහන් කර ගතිමි.

ඉහත වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සපයා ඇති පැහැදිලි කිරීම් පිළිබඳව මම පෞද්ගලිකව ම වග වන බව මෙයින් සහතික කරමි.

මෙයට,

අධ්‍යක්ෂ,
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ආයතනය
(කැලණිය විශ්වවිද්‍යාලය)

මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි,
අධ්‍යක්ෂ

පිටපත් : 01. ලේකම් - විශ්වවිද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය
03. සභාපති - විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව
04. උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය